මහා බලි පුරයෙහි ජෛන කලාශිල්ප

ශාස්ත්‍රාචාර්ය හිස්සැල්ලේ ධම්මරතන හිමියන්

ක්‍රි. ව. දෙවැනි ශත වර්ෂයෙහි පටන්ම වාගේ ජෛනාගම ද්‍රවිඩ දේශයෙහි (දකුණු ඉන්දියාවෙහි) ව්‍යාප්ත වී දියුණු වී ගියේය. සවැනි ශතවර්ශයේ අගභාගය වන තුරු ම එය උන්නත තත්ත්වයක පැවතිනි. මේ දීර්ඝ කාලපරිච්ඡේදය තුල ජෛනයෝ [1] සාහිත්‍ය - සංගීත - නාට්‍ය චිත්‍ර - මූර්ති - කැටයම් ආදි සෑම කලාවක් ම මහදුන්සාහයකින් වර්ධනය කළාහුය. පසු කාලයෙහි ඇතිවූ ආගම් වාදභෙද හේතුකොට ගෙන රටෙහි කැලඹීම් ඇතිවූ කල්හි ජෛනාගම ඒ උසස් තත්ත්වයෙන් ගිලිහී ගියේය. 7 වැනි සියවසේ මුල් භාගයේදී දකුණු ඉන්දියාවේ පහල වූ අප්පර් - සුන්දරර් - සම්බන්ධර් - මාණික්කවාසගර් යන ශෛව මුනිවරයන්ගේත්, ආල්වාර් නමින් හඳුන්වනු ලබන වෛෂ්ණව මුනිවරයන්ගේත් නිර්දය ප්‍රහාරයට ලක්වීම නිසා ජෛනාගම දකුණු ඉන්දියාවෙන් අතුරුදහන්වීය. එහෙත් දකුණු ඉන්දියාවෙහි ඔවුන් විසින් ඇති කරන ලද කලාගාරයන්හි නෂ්ටාවශෙෂ අදත් එහි දක්නා ලැබේ. අවාසනාවකට මෙන් [2]හින්දුන් විසින් ජෛන කලා ශිල්ප සහවා තබන ලදී. නැතහොත්, හින්දු ආගමට ගැලපෙන්නට ඒවා වෙනස් කරන ලදී. එසේ වුවද, ජෛන ශිල්පීන් ගේ සුරුබුහුටි අත්වලින් නිමවන ලද ගල්කැටයම් - බිතුසිතුවම් ගිරිගුහා හා ගලින් නෙලන ලද ආරාම මුළුමනින් ඔවුන්ට සහවා තබනු නොහැකිවිය. ජෛන කලාවන්ගේ කාන්තිය මේ සෑම අඳුරක්ම විනිවිද දුවන බැවිනි.

ජෛනයන් විසින් ඇතිකරන ලද බොහෝ කලා නිධානයන් අතර මහාබලිපුරයෙහි ගල්පරයක ඉදිරියට නෙරාසිටින සේ කොටා ඇති සුන්දර ගල්කැටයම් (Bas - Relief Sculpture) ප්‍රධාන, තැනක් ගනී. මේ සුන්දර කැටයම් වලට දැනට [3] දකුණුඉන්දියයෝ 'අර්ජුනගේ තපස', 'භාගීරථගේ තපස' යයි ව්‍යවහාර කරති. මෙහි කැටයම් කර ඇත්තේ 'අර්ජුනගේ තපස' හෝ 'භාගීරථගේ තපස' නොව ජෛනාගමට අයත් එක්තරා කථාන්තරයකි. ජෛනයන්ගේ 'අජිතනාදර් පුරාණය'

1. හින්දුන්ටත් වඩා ද්‍රවිඩ සාහිත්‍යයට අමරණීය සේවයක් කළේ ජෛනයෝය. ඔවුන් හැම අංශයකටම අයත් ද්‍රවිඩ සාහිත්‍ය කෘති දහස් ගණනක් සපයන්නට ඇත. එයින් බොහොමයක්ම ආගමීවාද නිසා විනාශකර දමන ලදී.
2. හින්දු ජනයා විසින් දකුණු ඉන්දියාවේ බෞද්ධ කලා ශිල්ප වලට ද කරන ලද්දේ මෙවැනි අතවරයකි.
3. මහාබලි පුරයෙහි කැටයම් හින්දුන්ට අයත් යයි මතයක් විය. එහෙත් අළුත් පර්යේෂණයන් නිසා ඒ මතය දැන් අතුරුදහන්වී තිබේ.

නැමති චරිතකථාවෙහි එන සගර චක්‍රවර්තිගේ කථාපුවත මේ කැටයම් වලින් පිළිබිඹු වේ. ජෛනාගමට ද්වේෂකරන්නන් මේ ජෛනකථාව යටපත්කොට එය මහාභාරතයෙහි හෝ රාමායණයෙහි එන හින්දුකථා පුවතක් යයි ඔප්පු කරන්නට වෙහෙස ගන්නා බව පෙනේ.

'මහාබලි පුරය' යනු මදුරාසියට දකුණෙහි සිට සැතපුම් 30 ක් පමණ දුරින්පිහිටි මුහුදු වෙරළාසන්න කුඩාගමකි. මහාබලි පුරයට මේ කාලයෙහි 'බාව්ලවරය' යන නමද ව්‍යවහාර කරනු ලැබේ. මේ බහාබලි පුරය යන නම ඇසෙනවිටම බහාබලි අසුරයාගේ වෘත්තාන්තයද කාගේවුවද සිහියට නැගෙයි. එහෙත් මහාබලි පුරයත්—බහාබලි අසුරයාත් අතර කිසිදු සම්බන්ධයක් නොපෙනේ. ක්‍රි: ව: 7 වැනි ශතවර්ෂයේ පමණ දකුණු ඉන්දියාව පාලනය කළ පල්ලව රජවරුන්ට මේ නගරය පටුන් ගමක් විය. පල්ලව රජවරුන්ගෙන් කෙනෙකුවූ නරසිම්හ වර්මන් රජ තමන්ගේ විරුද නම්වලින් එකක් වූ 'මාමල්ල' යන නම මේ නගරයට තැබිය. එතැන් පටන් මෙය 'මාමල්ලපුරය' නමින් ප්‍රසිද්ධ විය. එහෙත් පසු කාලයෙහි මේ නම ද අභාවයට ගොස් 'මහාබලිපුරය' යන නමත් 'මාවලිවරය' යන නමත් යළින් ව්‍යවහාර වන්නට පටන්ගති.

පල්ලවයන්ගේ රාජ්‍ය කාලයෙහි පටුන්ගමක් වශයෙන් ශොභාසම්පන්නව පැවති මේ නගරය දැන් කුඩාගමකි. එහෙත් මෙය කලාකරුවන්ගේ සිත් ඇදගත් රමණීය භූමිභාගයක් බව අප විසින් අමතක නොකළ යුතුය. අමෙරිකාව, යුරෝපය ආදි ඈත ප්‍රදේශවලින්ද, චීනය - බුරුමය - ජපානය ලංකාව - ජාවා - සුමාත්‍රා ආදි පෙරදිග රටවලින්ද එන යාත්‍රිකයෝ මහා බලිපුරය අමතක නොකරති. මේවූකලි රසකාමීන් කුල්මත් කරවන කලාගාරයකි.

ඉන්දියාවෙහි ශිල්පකලාවන් නිසා සුන්දරත්වයටත්, ප්‍රසිද්ධියටත් පත් ස්ථාන අතර ජෛන මහාබලිපුරය ප්‍රධානස්ථානයක් ගනී යයි කීම අතිශයොක්තියක් නොවේ.

මෙහි 'අර්ජුනගේ තපස' යන නමින් වරදවා ව්‍යවහාර කරනු ලබන සිත්කලු කැටයම් නෙලා ඇත්තේ ගල්පරයක පිහිටා ඇති පර්වතයක ඉදිරි පසය. මෙහි නැගෙන හිර පැත්ත දිග භිත්තියක් මෙන් සිටින්නට නිර්මාණය කර තිබේ. අඩි සයානුවක් පමණ දික්වූද, අඩි තෙසාළිසක් පමණ උස්වූද මට්ටම් කරන ලද ගල් පරයෙහි දක්ෂ ශිල්පීන් විසින් නෙලන ලද බොහෝ කැටයම් රූප මෙහි දක්නා ලැබේ. මේවායෙහි ගැබ්වී ඇති කලාකෞශල්‍යය පුදුම එළවන සුළුය. ක්‍රි: ව: 7 වැනි ශතවර්ෂයෙහි (මෙයින් වර්ෂ 1300 කට පමණ පෙර) නෙලන ලද මේ කැටයම් රූප මුහුදු සුලඟින් ද, අව්වැසි ආදියෙන් ද පහර ලැබ මදක් ඇඳිරි ස්වභාවයකට පත් වී ඇති නමුදු එහි ඇති සුන්දරත්වය අදත්, නොකැඩී පවතී.

ගල්පරයෙහි කොටන ලද මේ රූපවලින් අර්ජුනගේ තපස්රැකීම පිළිබිඹු වේ යයි ඇතමුන් කියන බව යට කියන ලදී. මහා භාරතයේ මහපර්වයෙහි ප්‍රකාශකරන ලද පරිදි අර්ජුන තපස් කොට ශිවදෙවියාගෙන් 'පාශුපදස්ත්‍රය' නම් ආයුධය ලැබූ පුවත මේ කැටයම් වලින් කිය වේ යයි ඔව්හු කියති. 1914 වර්ෂයේ ප්‍රංශ මහා විද්‍යාඥයකු වන ඇම්. වික්ටර් ගොලව්බීව් (M. Victor Golou-beau) මේ කැටයම් බලා 'මේ අර්ජුනගේ තපස් විස්තරයක් නොව රාමායණ කාව්‍යයේ බාල කාණ්ඩයෙහි කියන ලද භාගීරථගේ තපස් රැකීම' යයි ප්‍රකාශ කෙළේය. ඊට පසු බොහෝ දෙනෙක් මොහුගේ අදහස සර්වතොභද්‍රයයි හිස්මුදුනෙන් පිළිගත්හ.

එහෙත් මේ කැටයම් රූප සාවධානව, පරීක්ෂාකාරීව බැලුවහොත් මෙය අර්ජුන පාශුපදස්ත්‍රය ලැබූ කථාවවත්, භාගීරථ තපස් කොට ගඞ්ගානම් ගහ මහපොළොවට ගෙන්වූ කථාවවත් නොවන බව පැහැදිලිව පෙනෙනවා ඇත. මේ කථාවන් අතර හා මෙහි සඳහන් කැටයම් රූප අතර කිසි සම්බන්ධයක් නැති බව පැහැදිලිවෙයි. මේ කැටයම් රූප අතර තනි කකුලෙන් සිටගෙන දෙඅත් හිසමත තබාගෙන තපස්රකින රූපය අර්ජුනගේ යයිද, ඒ ඉදිරියෙහි අත් සතරක් ඇතිව සිටින දෙවියා ''ශිවදෙවියා'' යයි ද සමහරු කියති. මොවුන් පවසන මේ අදහස් පිළිගත හොත් මේ කැටයමෙහි දැක්වෙන අනෙක් රූපවල අදහස කුමක්ද යන ප්‍රශ්නය මතුවෙයි. මෙහි කැටයම් කර තිබෙන නාග කුමාරයෝත්, දිව්‍යසමූහයාත්, ඇත්හුත්, ගඞ්ගානම් ගහත්, කෝවිලත්, හිස් සුන් රූපතුනත්, අනෙක් බොහෝ මනුෂ්‍ය රූපත් මෙයට කියන නැකම කුමක්ද? තපස් කරමින් සිටි අර්ජුන වෙත ශිවදෙවියා වැදිවේශයක් ගෙන පැමිණි බවත්, උමාදේවිය වැදි අහනකගේ වේශය ගෙන ඔහු අනුව ආබවත් මහා භාරතයෙහි සඳහන් වෙයි. වැද්දකුගේ හෝ වැදි අහනකගේ රූ සටහන් මෙහි නොදක්නා ලැබේ. එහෙත් මේ කථාවට සම්බන්ධ නැති අනවශ්‍ය රූප මෙහි ඇති බව පෙනේ. තවද ඉන්දීය කලා ශිල්පක්‍රමය අනුව කථාවෙහි ප්‍රධානත්වය දරණ කථා නායකයන් වන අර්ජුනගේත් ශිවදෙවියාගේත් රූප විශාල කොට නෙලා, අප්‍රධාන පාත්‍රයන්ගේ රූප කුඩාකොට නෙලා තිබිය යුතුය. මේ කුටයෙහි එබඳු විශෙෂයක් නොපෙනේ. මෙහි දේවසමූහයා, ඇතා - කෝවිල - හිස්සුන් රූප ආදිය ප්‍රධාන

තැනක් ගෙන තිබේ. මේ සියල්ලම එකට ගෙන පරීක්ෂාකර බලන විට පෙනී යන්නේ මෙය අර්ජුන තපස් කිරීම පිළිබඳ කථාවක් නොව මෙයින් අමුතුම කථාවක් මෙහි පිළිබිඹු වී ඇති බවය.

ඇතමුන් කියන පරිදි මේ කැටයම් වලින් භාගීරථ තපස් කරන අයුරු පිළිබිඹු වේදැයි ඊලඟට පරීක්ෂාකර බැලිය යුතුය. ඇම්. වික්ටර් ගොලව්බ්ව් මහතා සිතන පරිදි මේ කැටයම් රූප මැද දක්නා ලැබෙන ගඞ්ගානම් ගහ විසිරී දුවන්නාක්මෙන් පෙනෙන දර්ශනය ප්‍රධාන තැනක් ගනී. එහෙත් ගඞ්ගානදියෙහි නාග රාජයකුත්, ඔහුගේ භාර්යාවත් පෙනී සිටීමට කරුණු මොනවාද? තනි කකුලෙන් සිටගෙන තපස් කරන රූපය භාගීරථයා යයි පිළිගනිතොත් ඔහු ඉදිරියෙහි අත් සතරක් ඇතිව තිබෙන රූපය ශිවදෙව් රූපයයි භාරගත නොමන්ද? මේ රූපයේ හිසෙහි ඔටුන්නක් දක්නා ලැබේ. ශිවට ඔටුන්නක් නොමැත. ඔහු ජටා දරන්නෙකි. එසේම මේ රූපයේ අතෙහි ගදයුධයක් වැනි ආයුධයක් දක්නා ලැබේ. ශිවදෙවියාට ගදයුධයක් නැත. ඔහුට ඇත්තේ ත්‍රිශූලය හා පොරව වැනි ආයුධයි. එබැවින් මේ රූපය ශිවදෙවියාගේ යයි ගත නොහැකිය. මෙහි දී මතුවන තවත් ප්‍රධාන කාරණයක් ඇත. 'භාගීරථගේ තපස්' නැමති කථාවෙහි ගඞ්ගානම් ගහ ආකාශයෙහි සිට මහත් වේගයකින් බිමට බට කල්හි ශිවදෙවියා එය තමාගේ ජටාවෙහි රඳවාගත් බව ප්‍රකාශවේ. මේ කැටයම්වල එවැනි දර්ශනයක් නොමැත. එසේම, මේ කැටයම්වලින් භාගීරථගේ තපස ප්‍රකාශ වන්නේ නම් ගඞ්ගාධරමූර්තිගේ රූපය මෙහි කැටයම් වී තිබිය යුතුය. එබන්දක් මෙහි නොපෙනේ.

ගඞ්ගාධර මූර්තිගේ සිත්කළු කැටයම් රූප නෙලන ලද්දේ පල්ලව කාලයේය. තවමත් ඒ රූප ඉන්දියාවේ නොයෙක් ප්‍රදේශවල දක්නා ලැබේ. කරුණු එසේනම් මේ රූප අතර ගඞ්ගාධර මූර්තිගේ රූපය නොදක්නා ලැබෙන්නේ ඇයි? එසේම මේ කොටුවට අයත් නොවන අලියා - නාගයන් - දෙවියන් - හිස්සුන් රූප - හිසනමා වඳින මුනිවරුන්ගේ රූප - කෝවිල ආදියට ප්‍රධාන තැනක් දී තිබෙන්නේ ඇයි? මේ සියල්ලම ගෙන සලකා බලන විට භාගීරථගේ තපසක් මේ රූප වලින් නොකියැවෙන බව සක්සුදක් සේ පෙනී යයි. මෙසේ මේ කැටයම් රූප පරීක්ෂාවෙන් නරඹනවිට මෙහි අර්ජුන තපස් කරන අයුරක් හෝ භාගීරථ තපස් කරන අයුරක් හෝ නොදක්නා ලැබේ.

එසේනම් මහාබලි පුරයෙහි ඇති මේ රූපවලින් කියැවෙන්නේ කුමක්ද? යනු සොයා බැලිය, යුතුය. ජෛන සාහිත්‍ය ග්‍රන්ථයන් පරීක්ෂාවෙන් කියවන විට මේ කැටයම් රූපවලින් ජෛනයන්ට අයත් කථාවක් කියැවෙන බව පැහැදිලිව පෙනී යයි. කථාව කියවා මේ කැටයම් රූපදෙස බලන විට මේ කරුණ හොඳින් පැහැදිලිවෙයි. අජිතනාථ දේවතා දෙවෙනි ජෛන තීර්ථඞ්කරගේ චරිත කථාවෙහි කියැවෙන [1]සගරචක්‍රවර්තිගේ කථාව මේ රූප වලින් නිරූපණය කොට තිබේ. මේ සගරචක්‍රවර්තිගේ කථාව රාමායණයෙහි කියනු ලබන සගර චක්‍රවර්තිගේ කථාව නොවේ. මෙය ජෛන පුරාණවල විස්තර වන ජෛන කථාවකි. මේ කථාව ද්‍රවිඩ සාහිත්‍යයට අයත් ශ්‍රී පුරාණයෙහිද, ජීවසම්බොධගෙ නැමති ග්‍රන්ථයෙහි ද දක්නා ලැබේ. [2]ත්‍රි ෂෂ්ඨීශලාකාපුරුෂ චාරිත්‍ර නැමති ග්‍රන්ථයෙහි ද මේ කථාව විස්තරවශයෙන් එයි. ජෛනාගම ඉන්දියාවෙහි ව්‍යාප්තව පැවති කාලයෙහි මෙය බෙහෙවින් ජනප්‍රිය වූ කථාවක් යයි කියනු ලැබේ. ඒ කථාව මේ ගල්පරයෙක කොටවන ලද්දේ ඒනිසාමය.

---

1. ලිපිය දක්වෙන බැවින් ඒ කථාව මෙහි සඳහන් නොකෙළෙමි.
2. මේ ග්‍රන්ථය හෙලන් ඇම්. ජොන්සන් මහත්මිය විසින් ඉංග්‍රීසියට පරිවර්තනය කර තිබේ.